



# ඩයියාගෙන්, 'සාදය මාරයි සල්ලි හමාරයි'

**සරා,** නෙවිල්, වජිරා, පීටර්සන්, ලලනි, රගු ඇතුළු මේ බක්කොමලා වෙලාවකට තමුන් කියන්නෙ මොනවද කියලා තමුන්ම නොදන්න ගාණයි. ඒත් ජීවිතය කොයි හැටි හෝ වේවා ගෙවාගෙන යන්න එපායැ. ඒ නිසා මේ අය තමුන්ට දැනෙන විදියට ජීවිතයට මුහුණ දෙනවා.

**සරා**

"මම ප්‍රතිපත්තියක් හැටියට ශෝකයට පත්වෙච්ච වෙලාවට කිසිම දෙයකට ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වෙන්නෙ නැහැ"

**නෙවිල්**

අවුරුදු තිස් ගාණක් තිස්සෙ කඹුරලා කඹුරලා හම්බ කරගත්ත සියලුම දේවල් වියදම් කළේ ඔයාගෙ පවුලේ උන්ටයි, මගේ පවුලේ උන්ටයි. අද මට බෝනස් ලැබිලා.



ධර්මප්‍රිය ඩයස්

**වජිරා**

මගේ පලාපල බැලුවා පත්තරේ. පෞද්ගලික ජීවිතේ වෙනසක් සිදුවේවි කියලා ඒකෙ කිව්වා.

**නෙවිල්**

හොර ගණුදෙනු සල්ලි වෙන්න ඇති. ඔය සල්ලි කාගෙවත් පොත්පත්වල පෙන්නුම් කරන්නෙ නැහැ.

**මේ විදියට සරා, නෙවිල්, වජිරා, රගු වගේ අය හමුවන්නේ "ඩයියා" හෙවත් රංගවේදී ධර්මප්‍රිය ඩයස්ගේ අධ්‍යක්ෂණයෙන් ප්‍රියංකර ද සිල්වාගේ නිෂ්පාදනයෙන් වේදිකාවට ගෙනා "සාදය මාරයි - සල්ලි හමාරයි" නාට්‍යයෙනුයි. වෙලාවකට ජීවිතයත් සාදයක් වගේ තමයි, එකිනෙකා තමුන්ට ඕනෑ විදියට ඒ සාදය** පවත්වාගෙන යනවා. හැබැයි ඉතින් සමහර අවස්ථාවලදී කරපු දෙයකුත් නැහැ. ධර්මප්‍රිය ඩයස් "සාදය මාරයි - සල්ලි හමාරයි" කියලා දැම්මෙ ඒ නිසාද දන්නෙ නැහැ. ඒක ඉතින් එයාගෙන්ම තමයි අහන්න ඕනෑ. අපි බලමු ඩයියා මේ "සාදය මාරයි - සල්ලි හමාරයි" ගැන කියන්නෙ මොනවද කියලා.

**• මේ ඔබගෙ කී වැනි නාට්‍ය නිර්මාණයද?**

දීර්ඝව කළ දෙවැනි නාට්‍ය නිර්මාණය මෙයයි

**• මෙය ඔබේ ස්වතන්ත්‍ර නිර්මාණයක්ද?**

මෙය වේ කුනි කියන එංගලන්ත නාට්‍යකරුවාගේ "ෆනි මනී" කියන පිටපත අනුසාරයෙන් කළ එකක්.

**• මේ විදියෙ නමක් දාන්න හිතුවෙ ඇයි?**

මේ පිටපතේ හැටියට මේ නම හොඳට ගැලපෙන බව හැඟුණා.

**• මෙය මොන විදියෙ නාට්‍යයක්ද?**

අපි මෙය කොමඩි නාට්‍යයක් කියලා ගනිමු. හැබැයි නිකම්ම වචන ටිකක් කියලා, මානසිකව හෝ ශාරීරිකව කරන කොමඩියකුත් නෙවෙයි. ඒ වගේම අර්ථාන්විත කොමඩියකුත් නෙවෙයි. ඒ ඒ අවස්ථාවට හැදෙන පරිසරය අනුව චරිත ඒ අවස්ථාවන්ට මුහුණ දෙනවා. මේ චරිත දන්නෙත් නැහැ, කොමඩිය මතුවන්නෙ මොන අවස්ථාවේදිද කියලා. ඒත් එය ප්‍රේක්ෂකයාට හැඟෙනවා.

**• ඒ කියන්නෙ රැල්ලට කළ කොමඩියක් නෙවෙයිද?**

කොහෙත්ම නැහැ. මුලින්ම මම රඟපෑවෙ "රෝමය ගිනිගනී" නාට්‍යයේ. එදා මම හිතුවෙ ඒ පිටපත ලියූ සමන් ලියනගේ වෙතින් පිටපතක් ලියා නාට්‍යයක් කිරීමටයි. ඉතින් මේ පිටපත වේ-කුණිගෙ අනුවර්තනයක් ලෙස මෙරට වේදිකාවට ගෙනාවෙ සමන් ලියනගේ.

**• ඔබ මෙහි කළ වෙනස්කම් මොනවද?**

ඇත්තටම මේ නාට්‍යයේ පිටපත මම රංග ශිල්පීන්ට ලබාදුන්නෙ නැහැ. රිහසල් වලට එන්න කියලා දින දුන්නා. ඉතින් රිහසල් වලට ආවාම එයාලට එයාලගෙ චරිතයට අදාළව කොටස් ලබා දුන්නා. රිහසල් කරන්න ගියාම එයාලටත් එය පැටලිලි සහගතයි. ඒක තමයි විය යුතුව තිබුණෙ සහ මට අවශ්‍ය වුණේ. කොහොම වුණත් "උඹ මේ පිටපත අපට කලින් නුදුන්නෙ මේ නිසා නේද?" කියලා පිරිස මගෙන් ඇහුවා. ඒ වුණාට අපි මෙක හරි සුන්දර විදියට කරගෙන ගියා.

**• ඒ රිහසල් කාලයේදී වෙච්ච සිදුවීම් එහෙමත් ඇති නේද?**



මේ නාට්‍යයම රසවත්නෙ. ඒ වගේම විනය ඇති පිරිසක් රඟපෑමට එක්ව සිටින්නෙ. ගිරිරාජ් ඉන්න තැන රස සාගරයක්නෙ. නමුත් මේ නාට්‍යයේ රසවත්කම නිසා එයාට රස කතා කීමට පවා වෙලාව නැතුව ගියා.

**• ඔබ වෘත්තියෙන් දෙහිවල ශාස්ත්‍රානන්ද විද්‍යාලයේ නාට්‍ය හා රංග කලා අංශයේ විෂයභාර ගුරුවරයෙක්. චිත්‍ර, සෞන්දර්ය හා උපාධිධාරී ගුරුවරයෙක් වන ඔබට ළමයින්ගෙන් ලැබෙන ප්‍රතිචාර මොන වගේද?**

මම පාසලට යන්නෙ නළුකම කියන දේ එක්ක නෙවෙයි. නළුකම ගැන කතා කරන්න යන්නෙත් නැහැ. එවිට එය රාජකාරියට බාධාවක්. නමුත් ළමුන් තමයි ඇත්තම විවේචනය කරන්නෙ. ඇත්තම දේ අවංකව ප්‍රකාශ කරන්නෙ. ඒක මම දන්නවා. ඒ නිසා ළමයින් කියන දේට මම ඇහුම්කන් දෙනවා.

**• මේ දිනවල ඔබගෙ රඟපෑම් දැකගත හැකි නිර්මාණ ගැන කිව්වොත්?**

"හුස්ම සහ ඔක්සිජන්" ටෙලි නාට්‍යයේ වගේම "ගුටි කෑමට නියමිතයි" වේදිකා නාට්‍ය එක්ක රටපුරා සංචාරය කරන බව කියන්න පුළුවනි.

**• කවදාහරි ගුටිකාලා තියෙනවද?**

පොඩි කාලයේදී ඉතින් පාසැල් සමයේදී එහෙම හොඳට ගුටි කාලා තියෙනවා. හොඳට ගහගෙන හොඳට ගුටිකාලා තියෙනවා.

**• දැන් මේ "සාදය ඉවරයි - සල්ලි හමාරයි" නාට්‍යය කවදද වේදිකාවට එන්නෙ?**

මෙම 17 සහ 18 දිනවලදී බොරැල්ල පුංචි තියටර් රඟහලේදී මෙහි මංගල දර්ශන පැවැත්වෙනවා. මේ වගේ නාට්‍යයක් නැත්නම් වේදිකාවෙ විඳවීමකින් තොරව වින්දනය කළ හැකි නාට්‍යයක් කිරීමට නිෂ්පාදනයෙන් දායකවූ "ප්‍රියංකර ද සිල්වා"ට අතිශයින්ම ස්තුතිවන්ත වෙන්න ඕනෑ.

**සඳුන් ගමගේ**



Scan with EasyScan